වාවකච්චේරි ප්‍රාදේශීය සභාව
යාපනය දිස්ත්‍රික්කය
---------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 31 දින සභාවේ ලේකම්ට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට වාවකච්චේරි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
---------------------------

පහත ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 57,562,303 ක් ගිණුම්වලට ගෙන නොතිබීමෙන් සමුච්චිත අරමුදල ගිණුම්වල අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) මෝටර් වාහන 4 ක්, සභාවේ නමට අයිතිය මාරු කරගෙන නොතිබුනද, ඒවායේ වටිනාකම ගිණුම්වලට ගෙනවිත් තිබීම නිසා මොටර් වාහනවල වටිනාකම රු. 9,161,200 කින් ගිණුම්වල වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) පළාත් පාලන නිලධාරින්ගේ විශ්‍රාම වැටුප් සහ විශ්‍රාම ප්‍රතිලාභ වශයෙන් ගෙවියයුතු රු. 50,724 ක මුදල ආදායම් වියදම් ගිණුමට ගෙනවිත් නොතිබීමෙන් වියදම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සභාව සතු වර්ග 15 ක ඉඩම් හා ගොඩනැගිලි 60 ක වටිනාකම ගිණුම්වලට ගෙනවිත් නොතිබීමෙන් වත්කම්වල වටිනාකම් ගිණුම්වල අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) වියදම් 5 ක් සඳහා වෙන්කළ මුදලින් වියදම් වලින් පසු ඉතිරිවූ මුදල වන රු. 214,747 ක් ආදායම් ගිණුමට මාරුකර නොතිබීමෙන් රු. 214,747 ක ආදායම් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

1.3.3 ලේඛන හා පොත්පත් නොපැවැත්වීම
-----------------------------------------------

සභාව විසින් මිණුම් ලේඛනය,ඉඩම් විකුණුම් බදු ලේඛනය,හානි පාඩු ලේඛනය යනාදි ලේඛන පවත්වා නොතිබුණි.

1.3.4 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විස්තර සඳහන් කර නොමැති රු. 71,845 ක අත්තිකාරම් ගිණුමේ ශේෂය අයකර ගැනීමට හෝ ලියා හැරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) ග්‍රාම සංවර්ධන සමිතිය සභාපති වෙත ලබාදී තිබූ රු. 145,210 ක අත්තිකාරම් මුදල මෙතෙක් පියවා නොතිබුණි.

(ඇ) රු. 100,807 ක ගෙවියයුතු තැන්පත් මුදල අදාල දෙපාර්තමේන්තුවට හෝ අදාල පුද්ගලයාට ගෙවා නොතිබුණි.

1.3.5 විගණන සඳහා සාක්ෂි නොවීම

සනාථ කරන ලද ප්‍රතිලාභින්ගේ ලැයිස්තු නොමැතිවීමෙන් රු. 50,680 ක් වටිනා ගෙවීම පිළිගැනිමට නොහැකි විය.

1.3.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත පරිච්ඡේදයේ V වගන්තිය 148(1) | වාහන සහ සතුන් සම්බන්ධයෙන් බදු පැනවීමට ප්‍රදේශීය සභාවට බලය පවරා තිබුණද, එම වාහන සහ සතුන් සඳහා නියමිත බදු ප්‍රතිශතයක් අයකර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 571 | රු. 2,720,145 ක කල්ඉකුත්වූ තැන්පත් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 44,710,142 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම් ඉක්මවූ ආදායම රු. 27,936,006 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ අවසන් මූල්‍ය ප්‍රතිඵලය රු. 16,774,136 කින් වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සභාවේ මූල්‍ය ප්‍රතිඵලය ශුද්ධ අතිරික්තය රු. 17,885,039 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු. 2,267,037

ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ අවසාන මූල්‍ය ප්‍රතිඵලය රු. 15,618,002 කින් වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය
-------------------------------------

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශනය අනුව සභාවේ සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 83,055,335 ක්වූ තිබූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 48,570, 097 ක් වී තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 34,485,238 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.4 ආදායම් පරිපාලනය
------------------------

2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්‍යසාධනය
--------------------------------------

ලේකම් විසින් ඉදිරිපත් කර තිබූ පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2016 | | |
|---|---|---|---|
| | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 106 | 120 | 554 |
| බදු කුලී | 14,930 | 11,769 | 182 |
| බලපත්‍ර ගාස්තු | 1,402 | 1,518 | 6 |
| වෙනත් ආදායම් | 66,515 | 73,941 | 57 |
| එකතුව | 82,953 | 87,348 | 799 |

2.4.2 වරිපනම් බදු
-------------

පසුගිය වසර 10 කට වඩා වැඩි කාලයක සිට වත්කම් සඳහා වත්කම් නව තක්සේරු කිරීම සිදුකර වරිපනම් බදු ආදායම් අයකර නොතිබුණි.

2.4.3 බදු
----

රු. 45,875 ක බදු මුදල් අද දක්වා අයනොකර හිඟව තිබුණි.

2.4.4 බලපත්‍ර ගාස්තු
----------------

රු. 5,850 ක බලපත්‍ර ගාස්තු අයනොකර හිඟව තිබුණි.

2.4.5 වෙනත් ආදායම්

-------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවට අයත් සුසාන භූමි 23 කින් සුසාන භූමි බදු අයකර නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයේ ඉදිකර තිබූ විදුලි සංදේශ කුළුණු 03 කින් වාර්ෂික බදු අයකර නොතිබුණි.

2.4.6 මුද්දර ගාස්තු

---------------

ඉඩම් රෙජිස්ටාර් ජනරාල්වරයාගෙන් රු. 74,365,765 ක් වටිනා මුද්දර ගාස්තු අයකර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 98 ක් වුවද තත්‍ය සේවක සංඛ්‍යාව 79 කි. ඒ අනුව සේවක පුරප්පාඩු 20 ක් හා තනතුරු 01 ක අතිරික්තයක් තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයෙන් මාර්ග 29 ක් සංවර්ධනය කිරීම සඳහා රු. 36,578,420 ක මුදලක් අනුමත කර තිබුණද, මෙතෙක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) 2016 වර්ෂයේ නළළිං ඉදිකිරීම සඳහා ලබාදුන් රු. 75,000 ක මුදල් අදාල කාර්යන් සඳහා යොදවා නොතිබුණි.

(ඈ) ඝන අපද්‍රව්‍ය ශාලාවට වැට සෑදීම සඳහා වෙන් කරන ලද රු. 101,272 ක් ප්‍රයොජනයට ගෙන නොතිබුණි.

(ඉ) විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් වාර්ෂිකව පැවත්විය යුතු වුවද, අදාල සභාව විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

ප්‍රජා ශාලා පරිත්‍යාග රු. 86,536 ක මුදල් අදාල අරමුණ සඳහා යොදවා ගෙන නොතිබුණි.

3.3 ඌන උපයෝජිත වත්කම්

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව සතු අත් ට්‍රැක්ටර් වර්ෂ 5 කට වඩාවැඩි කාලයක සිට නිෂ්ක්‍රියව තිබුණි.

(ආ) පොළවල් 02 ක් වර්ෂ 03 ක කාලයක සිට අදාල අවශ්‍යතාවය සඳහා යොදවා ගෙන නොතිබුණි.

3.4 ප්‍රමාදවූ ව්‍යාපෘත්ති

--------------------

රු. 9,287,475 ක් වටිනා ප්‍රාග්ධන වැඩ 57 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

4 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

----------------------------------------

අයවැය පාලනය

-----------------

වියදම් ව්‍යුහය

---------------

අයවැයගත වියදම් සහ තත්‍ය වියදම් අතර රු. 67,803 සිට රු. 43,257,176 දක්වා විචලනයක් විගණනයේදී නිරීක්ෂණය විය.